# අපරාධ චෝදනා ලැබූවන් ඇමැති ආරක්ෂක සේවයේ ඉන්නවා දැයි සොයන්න

ලක්බිම 2018 ජූලි 24 අඟහරුවාදා

## පැෆරල් පොලිස්පතිවරයාට ලියයි

ගයාත්‍රි ගීගනආරච්චි

**විවිධ** අපරාධවලට චෝදනා ලැබ සිටින පිරිස් ඇමැතිවරුන් ඇතුළු දේශපාලනඥයන්ගේ ආරක්ෂකයන් ලෙස කටයුතු කරන්නේද යන්න සොයා බැලීම සඳහා වැඩපිළිවෙළක් සකසන ලෙස ඉල්ලමින් පැෆරල් සංවිධානය පොලිස්පතිවරයා වෙත ලිපියක් යවා තිබේ.

එවැනි පුද්ගලයන් ඇතැම් දේශපාලනඥයන්ගේ සමීපතම ආධාරකරුවන් මෙන්ම ආරක්ෂකයන් ලෙස කටයුතු කරන බවට වරින් වර සමාජය තුළ කතාබහ මතුවී තිබෙන අතර ඒ තුළින් මහජන නියෝජිතයන් කෙරෙහි ජනතාව තුළ පවතින විශ්වාසය බිඳවැටෙනු ඇතැයි එම සංවිධානය සිය ලිපිය මගින් පෙන්වා දී ඇත.

මහජන නියෝජිතයන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා මෙන්ම මහජන නියෝජිතයන් කෙරෙහි ජනතාව තබා ඇති විශ්වාසය පවත්වාගැනීම සඳහා මෙම ඉල්ලීම කරන බවද එම ලිපියේ සඳහන් කර තිබේ.